**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2018/2019**

**INR 4186: සමකාලීන ඉන්දියාව**

කාලය: <u>පැ දෙකයි (02)</u>

ඕනෑම ප්‍රශ්න <u>තුනකට (03)</u> පිළිතුරු සපයන්න.

1. සමකාලීන ඉන්දියාවේ ගති ලක්ෂණයන් පහත සඳහන් උප මාතෘකා කෙරෙහි අවධානය යොමුකරමින් විස්තර කරන්න.

   i. ඉන්දියානු භූ-දේශපාලනය

   ii. ඉන්දියානු උපායමාර්ගික අවස්ථා

   iii. ආරක්ෂක අභියෝගයන්

2. ඕනෑම 'පස් අවුරුදු සංවර්ධන සැලසුම්' දෙකක් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉන්දියානු ආර්ථික වර්ධනය හා සංවර්ධනය පිළිබඳව විචාරාත්මකව ඇගයීමක් කරන්න.

3. ඉන්දියානු විදේශ ප්‍රතිපත්තිය පහත තේමා යටතේ විභාග කරන්න.

   i. ජවහල්ලාල් නේරුගේ ඉන්දියානු විදේශ ප්‍රතිපත්තිය සඳහා පදනම් දායකත්වය

   ii. නරේන්ද්‍ර මෝදිගේ අසල්වැසි ප්‍රමුඛ ප්‍රතිපත්තිය

   iii. ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා

4. "ඉන්දියානු මැතිවරණය 2019 අප්‍රේල් 11 දින සිට 2019 මැයි 19 දක්වා කොටස් 07 ක් යටතේ පැවැත්විණි". එයට අදාලව පහත මාතෘකා සාකච්ඡා කරන්න.

   i. ඉන්දියානු දේශපාලන පක්ෂ

   ii. ප්‍රධාන දෙශපාලන පක්ෂ දෙකෙහි ජනප්‍රිය දේශපාලන නායකත්වයන්

   iii. භාරතීය ජනතා පක්ෂයේ (BJP) විජයග්‍රහණයට හේතු වු කරුණු

5. පහත සඳහන් <u>**සියළුම**</u> ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

   i. 'මෘදු බලය' නිර්වචනය කරන්න.

   ii. ඉන්දියානු මෘදු බලය පිළිබඳ උදාහරණ 5ක් නම් කරන්න.

   iii. අවම වශයෙන් උදාහරණ දෙකක්වත් යොදාගෙන ඉන්දියානු මෘදු බලයේ බලපෑම සාකච්ඡා කරන්න.

6. සමාජ - සංස්කෘතික වශයෙන් සමකාලීන ඉන්දියානු සමාජය මුහුණදෙන අභියෝග පිළිබඳව රචනයක් ලියන්න.

**************************